**#mediaethicsSL #SinhalaPress #lka #Divaina #Lakbima #April22**

ඉන්දියාවේ කුඩා දැරියක දිගින් දිගටම ලිංගික අපරාධයට ලක් කොට, තිරශ්චීන ලෙසින් ඝාතනය කිරීමේ සිදුවීම ශ්‍රී ලංකාවේ අපටද කම්පනයක් ඇති කිරීමට සමත් වූ පුවතකි. මෙහිදී මෙම සිදුවීම ඉන්දීය මාධ්‍ය විසින් වාර්තා කළ ආකාරය සම්බන්ධයෙන් චෝදනා පමණක් නොව, එම මාධ්‍යයන්ට දඩ ද නියම වී ඇත. ශ්‍රී ලංකාවේ පුවත්පත් මගින් මෙම ප්‍රවෘත්තිය වාර්තා කර ඇති ආකාරය දෙස බැලීමේදී අපට කීමට ඇත්තේ කුමක්ද?

ඇයගේ ඡායාරූපය පළ කිරීමමට පමණක් නොව, ඇයගේ මෘත දේහයේ ඡායාරූපය පවා බොඳ කිරීමකින් හෝ තොරව පළ කිරීමට ඇතැම් මාධ්‍ය කටයුතු කර ඇත. මෙය මාධ්‍ය ආචාර ධර්මයන් විෂයෙහි තවමත් විවාදයට ලක්වූ කරුණක් වුවත්, ලිංගික අපරාධයක වින්දිතයෙකුගේ ඡායාරූපය හෝ මෘත දේහයේ ඡායාරූප පළ නොකිරීම වඩාත් යෝග්‍ය වනු ඇත. මෙවැනි සිදුවීමක වින්දිතයාගේ නම ප්‍රකාශයට පත් කිරීම ඉඳුරාම මාධ්‍ය ආචාර ධර්මයන්ට පටහැණි වුවත්, මේ වනවිට එය දෙස් විදෙස් තුළ ප්‍රකට වී තිබෙනා බව අපට බැහැර කළ නොහැක. එසේම වින්දිතයාව අපවිත්‍ර වී ඇති බව හැඟවෙන දූෂණය වැනි යෙදුම් වලට වඩා යෝග්‍ය වන්නේ "ලිංගික අපරාධය" යන්නයි. එතැනින් එහාට වරදකරුවන් කිරීමට පෙරාතුව සැකකරුවන්ගේ සේයාරූ පළ කිරීමද මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල නොවේ. මෙය විදෙස් පුවතක් යැයි කෙනෙකු තර්කයක් නැගිය හැකි වුවත්, එය පළ කෙරෙන්නේ මෙරට පුවත්පතක නම් උක්ත දක්වා ඇති කරුණු කාරණා එයින් වෙනස් නොවේ.